## ULA AS 2014 - 07

# මහජන පුස්තකාල එකතුව පිළිබඳ පාඨකයන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ අධ්‍යයනයක් (කොළඹ දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල ඇසුරින්)

සකුන්තලා සෙනෙවිරත්න,
සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය
saku@lib.ruh.ac.lk

මහජන පුස්තකාලවල එකතුව පිළිබඳ පාඨකයාගේ තෘප්තිමත්භාවය සොයා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි. ඒ සඳහා පාඨකයන් වැඩි වශයෙන් භාවිත කරන තොරතුරු මාධ්‍ය මොනවාද, පුස්තකාල එකතුව තුළින් වඩාත් ප්‍රිය කරන එකතුව කුමක්ද, පාඨකයාගේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පුස්තකාල එකතුව සංවර්ධනය වී ඇති ආකාරය පිළිබඳ පාඨකයන්ගේ ප්‍රතිචාර කෙසේ ද, එකතුව පිළිබඳ පාඨකයා සෑහීමකට පත්වන්නේද යන්න පිළිබඳව සොයා බැලීම මෙහි සෙසු අරමුණු වේ.

මෙම පර්යේෂණය සඳහා කොළඹ දිස්ත්‍රික්කය පමණක් ආවරණය කරන මහජන පුස්තකාල අතුරින් මහ නගර සභා මගින් ක්‍රියාත්මක වන පුස්තකාල 2 ක් ද, නගර සභා මගින් ක්‍රියාත්මක වන පුස්තකාල 2 ක් ද, ප්‍රාදේශීය සභා මගින් ක්‍රියාත්මක වන පුස්තකාල 2 ක් ද යොදා ගනිමින් ඒ ඒ පුස්තකාලයන්හි පාඨකයන් 150 ක් සඳහා ප්‍රශ්නාවලී යොමු කරමින් දත්ත ලබා ගැනීම සිදු කළ අතර වගු හා ප්‍රස්ථාර ආශ්‍රයෙන් එවා විශ්ලේෂණය කොට ඉදිරිපත් කරන ලදී.

මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය වූ ප්‍රධාන කරුණ වූයේ ලංකාවේ මහජන පුස්තකාලවල සම්පත් එකතුව පිළිබඳ පාඨකයාගේ තෘප්තිමත් භාවයක් නොමැති බවයි. එය ප්‍රතිශතයක් ලෙස 46.70% කි. පාඨකයන් වැඩි වශයෙන් භාවිත කරනුයේ තොරතුරු මාධ්‍ය එකතුව බව හා වැඩි ප්‍රියතාවයක් දක්වන එකතුව පොත්පත් එකතුව බවත් 44.70% ක ප්‍රතිශතයකින් අනාවරණය විය. තවද පාඨකයාගේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමට හැකි සුදුසු එකතුවක් නොමැති බවත්, දැනට පවතින එකතුව ද යල් පැන ගිය තොරතුරු එකතුවක් බවත්, කාලීන තොරතුරු ඇතුළත් එකතුවක අවශ්‍යතාවයක් පවතින බවත් පාඨක ප්‍රතිචාරවලින් අනාවරණය විය.

පුස්තකාල එකතුව පිළිබඳ පාඨකයාගේ තෘප්තිමත්භාවයක් නොමැති බවත්, පාඨකයන් වැඩි වශයෙන් භාවිත කරනුයේ පොත්පත් එකතුව බවත්, පුස්තකාල එකතුවෙහි ප්‍රමාණාත්මක බව පිළිබඳ සෑහීමකට පත් නොවන බවත් මෙම අධ්‍යයනයෙන් නිගමනය විය. ඒ අනුව පුස්තකාලයේ සම්පත් එකතුව සඳහා නව තොරතුරු මාධ්‍ය ප්‍රතිග්‍රහණය කළ යුතු බවත්, පාඨකයාගේ තොරතුරු අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙස එකතුව සංවර්ධනය කළ යුතු බවත්, ඒ සඳහා භෞතික හා මානව සම්පත් වර්ධනය කිරීමත්, ප්‍රමාණවත් තරම් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමත් සුදුසු බව යෝජනා කළ හැකිය.

*මූල පද : මහජන පුස්තකාලය, පුස්තකාල එකතුව, පාඨක තෘප්තිමත්භාවය*